# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: (94) 011- 2694560 Telephone
ෆැක්ස් / தொலைநகல்: (94) 011- 2692254 Fax
ඊ-මේල් / மின்னஞ்சல்: dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/04

ඔබේ අංකය / Your No:

දිනය / திகதி / Date: 2020.10.22

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් පූර්ව සේවයේ 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීම මත සංවර්ධන නිලධාරී සේවයේ 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව මගේ අංක CS/DOS/05/03/01 හා 2018.02.16 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන් අන්තර්ග්‍රහණය කරන ලද දිනට (එනම් 2011.08.01 දිනට) පෙර අනුමත බඳවා ගැනීම් පටිපාටියේ 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන් සමත් වී ඇති විට, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ 17.1 වගන්තිය අනුව සංවර්ධන නිලධාරී සේවයේ 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කළ බවට ඔබ විසින් අදාළ නිලධාරියා දැනුවත් කිරීම ප්‍රමාණවත් බව කාරුණිකව දන්වමි.

03. එසේම එම නිලධාරීන්ගේ ස්ථිර කිරීම්, උසස් කිරීම් හෝ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්බන්ධයෙන් විමසීමකදී එකී ලිපියෙහි පිටපතක් හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ ප්‍රතිඵල සටහනෙහි පිටපතක් මා වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන්ද වැඩිදුරටත් දන්වමි.

04. කෙසේ නමුත් කිසියම් නිලධාරියෙකු පූර්ව සේවයේ බඳවා ගැනීම් පටිපාටියෙහි දැක්වෙන 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2011.08.01 දිනට පසු සමත් වී ඇති අවස්ථාවක, 2 වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කිරීම ඔබ විසින් නොකළ යුතු අතර, එවැනි නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් සහන ලබාදීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්